**දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2016**

**-----------------------------------------------------------------------**

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 23(2) වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 අධිකාරිය පිහිටුවීම හා එහි ක්‍රියාකාරීත්වය

-----------------------------------------------

2006 සැප්තැම්බර් 01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 11 වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලද 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත මගින් 2008 වර්ෂයේදී මෙම අධිකාරිය පිහිටුවා තිබුණු අතර එතැන් සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සිදුකරන ලද සියළු ගනුදෙනු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරිය වෙනුවෙන් ප්‍රථම වරට මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ගොඩනැගිලි සවිකිරීම්වලින් සියයට 4 ක් වාර්ෂිකව ක්ෂය කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස හෙළිදරව් කර තිබුණු නමුත්, සියයට 2 ක් පමණක් ක්ෂය කර තිබුණු බැවින් වාර්ෂික ක්ෂය වියදම රු.34,013 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 | අවස්ථා 19 කදී එකතුව රු.855,248 ක තත්කාර්ය අතුරු අග්‍රිම අධි ඇස්තමේන්තු මත නිකුත් කර තිබුණු බැවින් ඉන් සියයට 25 ත් සියයට 79 ත් අතර ප්‍රතිශතයක් හෙවත් එකතුව රු.400,869 ක් ඉතිරිව පැවතුණි. චක්‍රලේඛය ප්‍රකාරව අදාළ කාර්ය නිමවී දින 10 ක් ඇතුළත තත්ත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, අවස්ථා 18 කදී නිකුත් කර තිබුණු එකතුව රු.674,187 ක අග්‍රිම දින 12 සිට දින 61 දක්වා කාලපමාවකින් පසු බිල්පත් මගින් පියවා තිබුණු අතර අවස්ථා 26 කදී නිකුත්කර තිබුණු අග්‍රිමවලින් ඉතිරි මුදල් රු.424,035 ක් දින 02 සිට දින 27 දක්වා කාලපමාවකින් පසු ආපසු පියවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය | සැපයුම්කරුවන් වෙත අවස්ථා 18 කදී ගෙවන ලද රු.1,514,932 ක එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය.**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,625,716 ක ඌනතාවයක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු අධිකාරියේ දායකත්වය රු.2,163,005 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්ය සාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 14 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කර්තව්‍යයන් පහත පරිදි විය.

- ❖ දුම්කොළ නිෂ්පාදන හා මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට, ප්‍රතිපත්තිවල ගැටළු සමීක්ෂණය කිරීමට සහ වෙනස්කම් ඇති කිරීමට ආණ්ඩුවට උපදෙස් දීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන නීතිමය, ආදායම් බදු, පරිපාලන හා අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණ හා ඇගයීම් කිරීම, ගැටළු පිළිබඳ පර්යේෂණ දිරි ගැන්වීම හා ඊට සහාය වීම.

- ❖ ජනමාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් සහ ප්‍රජාමූලික වැඩසටහන් මගින් සෞඛ්‍ය වර්ධනය දිරි ගැන්වීම හා සහයවීම, ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය දිරි ගැන්වීම, මහජනයාගෙන් තොරතුරු භාර ගැනීම සහ අදාළ ආයතනවලට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කිරීම.

- ❖ දුම්කොළ නිෂ්පාදන හා මධ්‍යසාර නිෂ්පාදන පරිභෝජනයෙන් උද්ගත වන හානිය අවම කර ගැනීම සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම හා ඒ සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිත ආයතනවල සම්බන්ධීකරණ නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීම.

- ❖ අනිසි ඖෂධ භාවිතය වැලැක්වීම හෝ අවම කිරීම සඳහා ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය විමසා වැඩ පිළිවෙලවල් සකස් කිරීම.

- දුම්කොළ නිෂ්පාදනය හා මධ්‍යසාර නිෂ්පාදනය, සැකසීම, පරිභෝජනය සහ අලෙවියට අදාළ ආර්ථික, සෞඛ්‍ය හා වෙනත් ගැටළු සමීක්ෂණය කිරීම, පාවිච්චිය හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය කිරීම.

- දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ සියළු සංවිධානවල සහභාගීත්වය ලබා ගැනීම.

- දුම්කොළ හා මධ්‍යසාර සම්බන්ධව සියළු විමර්ශන සහ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ මධ්‍යසාර සහ දුම්කොළවලට සම්බන්ධ ගැටළු පිළිබඳව දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාවය ගොඩනගා ගැනීම.

ඉහත දක්වා ඇති කර්තව්‍යයන් අතරින් ජනමාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් සහ ප්‍රජාමූලික වැඩසටහන් මගින් සෞඛ්‍ය වර්ධනය දිරි ගැන්වීම හා සහායවීම, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ සංවිධානවල සහභාගීත්වය ලබා ගැනීම යන කර්තව්‍යයන් හැරුණු කොට අනෙකුත් කර්තව්‍යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ඉටුකළ යුතු කර්තව්‍යයන් 24 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 40 ක මූලධන ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් සලසා තිබුණු අතර ඊට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු නොකිරීම නිසා කර්තව්‍යයන් 11 ක් ඉටුකර නොතිබූ අතර රු.මිලියන 5.7 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඊට අමතරව අනු ක්‍රියාකාරකම් 4 ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.මිලියන 6.75 ක ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 1.62 ක් වැය කර තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල කළමනාකරණය

-------------------------------------

අධිකාරිය විසින් තම කාර්යභාරය ඉටුකිරීම සඳහා තනතුරු 30 ක් සහිත කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණු නමුත්, 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් තනතුරු 08 ක් සඳහා පමණක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත්, 2016 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය කාර්ය මණ්ඩලය 07 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම අධිකාරිය සතු කර්තව්‍යයන් නිසි පරිදි ඉටුකිරීමට බාධාවක් වී තිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

අධිකාරියේ පරිපාලන කාර්යාලය සඳහා නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම සතු ගොඩනැගිල්ලක එකොළොස්වන මහලේ වර්ග අඩි 2,949 ක් 2013 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කුලියට ගෙන එකතුව රු.29,193,041 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණි. එහෙත් 2013 පෙබරවාරි සිට අධිකාරියේ සංස්ථා කාර්ය මණ්ඩලය 03 දෙනෙකු සහ 2013 නොවැම්බර් සිට 07 දෙනෙකුට සීමාවී තිබීම හේතුවෙන් අවශ්‍යතාවය ඉක්මවා ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම.

--------------------

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන ලෙස ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් අධිකාරියේ ප්‍රගතිය පිළිබඳ නිසි සමාලෝචනයක් කළ නොහැකි විය.

### 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.